(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 158.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 ජුනි 24 බදාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1503/2025

ගරු බී. ආරියවංශ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වගා කරන ලද භූමි ප්‍රමාණය සහ ගම්මිරිස් නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව දිස්ත්‍රික්ක මට්ටමෙන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කාලය තුළ ගම්මිරිස් අපනයනය කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ගම්මිරිස් වගාකරුවන් තවදුරටත් දිරිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1546/2025

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති වතු පේළි නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම පේළි නිවාසවල ජීවත් වීමට සුදුසු පරිසරයක් පවතින බවට නිසි පරීක්ෂාවක් සිදු කර තිබේද;

(iii) අදාළ වතු සමාගම් විසින් එම පේළි නිවාස නිසි පරිදි නඩත්තු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iv) නිසි පරිදි නඩත්තු කර නොමැති පේළි නිවාස සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1637/2025

ගරු රුවන් විජේවීර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 'සැමට සෙවන' ව්‍යාපෘතිය යටතේ, මොනරාගල දිස්ත්‍රික්කය තුළ ඉදිකිරීමට සැලසුම් කරන ලද නිවාස සංඛ්‍යාව සහ සම්පූර්ණයෙන්ම වැඩ අවසන් කරන ලද නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගන්නා ලද මූලාශ්‍රය කවරේද;

(iii) මෙම නිවාස ව්‍යාපෘතිය සඳහා, ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී යොදා ගන්නා ලද නිර්ණායක කවරේද;

(iv) මෙම ව්‍යාපෘතිය යටතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(v) ඒ සඳහා වෙන් කරන ලද මුදල සහ සත්‍ය වශයෙන් වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1641/2025

ගරු ඉම්රාන් මහරුෆ් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවල නම් කවරේද;

(iii) එම ඩිපෝවල දැනට ධාවනයේ යෙදවිය හැකි තත්ත්වයේ පවතින බස් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් ඩිපෝවල පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඩිපෝවල බස් රථ හා මානව සම්පත් වැඩිදියුණු කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති හෝ ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1673/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සින්න උල්ල, අරුගම්බේ, සර්වෝදයපුර, ජලාල්දීන් චතුරශ්‍රය, කුඩා කල්ලිය, විස්කි පොයින්ට්, කොට්ටුක්කල් සහ ලයිට් හවුස් වැනි සංචාරක ප්‍රදේශවල නිවාඩු නිකේතන පවත්වාගෙන යන පුද්ගලයන් සතු ඉඩම් සඳහා රජය විසින් මැනුම් සිදුකර ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(ii) එම ලිපිලේඛන නොමැති නිවාඩු නිකේතන, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කිරීමට නොහැකි බව පිළිගන්නේද;

(iii) ඒ හේතුවෙන් පොතුවිල් ප්‍රාදේශීය සභාවට අදාළ ව්‍යාපාර බදු අය කිරීමට නොහැකිවී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය යටතේ පෞද්ගලික මැනුම්කරුවන් මඟින් ඉඩම් මැනුම් සිදුකර ‘උරුමය’ ඔප්පු කඩිනමින් ලබා ගැනීමට අවස්ථාවක් ලබා දෙන්නේද;

(v) එසේ සකස් කරන මිනින්දෝරු සැලසුම් භාවිතා කර එම ඉඩම් ‘උරුමය’ යෝජනා ක්‍රමයට ඇතුළත් කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1831/2026

ගරු කන්දසාමි ප්‍රභු මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයට අදාළව 2025/2026 වසර සඳහා යෝජනාවී ඇති කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත කලාපයේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ මඩකලපුව ශාඛාව හරහා මෙම වසර තුළ කාර්මික පුහුණුව ලැබූ දේශීය ව්‍යවසායකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) මඩකලපුව දිස්ත්‍රික්කයේ කුඩා හා මධ්‍යම පරිමාණ අත්යන්ත්‍ර කර්මාන්ත සඳහා වෙළඳපොළ අවස්ථා පහසු කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත සඳහා ලබාදී ඇති අඩු පොලී ණයවල සමස්ත වටිනාකම කොපමණද;

(v) නැගෙනහිර පළාතේ කෘෂි නිෂ්පාදන ආශ්‍රිත කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත සඳහා විශේෂිත බදු සහන ලබා දීමට කටයුතු කර තිබේද;

(vi) මඩකලපුව දිස්ත්‍රික්කයේ අපහසුතාවයන්ට ලක්වී සිටින ව්‍යවසායකයින් සඳහාවූ ‘SME ඇපකර අරමුදල’ හි වර්තමාන ප්‍රගතිය කවරේද;

(vii) එම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ඇසුරුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා සැලසුමක් තිබේද;

(viii) ආනයනික විකල්පවලින් දේශීය කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1920/2026

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අංගම්පිටිය මාර්ගය, ඇතුල්කෝට්ටේ සහ පාසල් මාවත, රාජගිරිය, නාවලදී සම්බන්ධ කරමින් රාජගිරිය, නාවල ඇළ හරහා නව පාලමක් ඉදිකිරීමට කටයුතු කරන බව දන්නේද;

(ii) එම පාලම ඉදිකරන ප්‍රදේශය ජෛව විවිධත්වය සහ පුරාවිද්‍යාත්මක වශයෙන් ඉතා සංවේදී කලාපයක් බව දන්නේද;

(iii) එසේ නම්, එම පාලම ඉදිකිරීම සඳහා අවශ්‍ය පාරිසරික, රථ වාහන තදබදය, සමාජ-ආර්ථික සහ පුරාවිද්‍යාත්මක බලපෑම් වාර්තා ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1993/2026

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන පළාත් රාජ්‍ය සේවයට සැලකිය යුතු රාජ්‍ය සේවකයින් සංඛ්‍යාවක් අයත් වන බව පිළිගන්නේද;

(ii) වයඹ පළාත් රාජ්‍ය සේවය සඳහා අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) එම සේවයේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පවතින පුරප්පාඩු පිරවීමට සහ කටයුතු විධිමත් කිරීම සඳහා ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— වරප්‍රසාද (අංක 1),— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2026 මැයි 21 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

2.

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— වරප්‍රසාද (අංක 2),— ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. එම්. මරික්කාර් මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 නොවැම්බර් 13 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

3.

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— වරප්‍රසාද (අංක 3),— ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2026 ජුනි 10 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

ජාතික පාරිසරික (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියමය,— 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 1(2) වගන්තිය යටතේ එවකට බලශක්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මාර්තු 05 දිනැති අංක 2478/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පුරාවස්තු ආඥාපනත යටතේ නියෝග,— (188 අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 46 වගන්තිය සමඟ කියවිය යුතු 47 වගන්තිය යටතේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් 2026 අප්‍රේල් 11 දින සාදන ලදුව, 2026 ජූනි 12 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*10.

විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— "2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

13.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

14.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

15.

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

16.

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

887/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී එරාවුර්පත්තු, වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අයදුම් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එරාවුර්පත්තු, වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචිවී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

888/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019.01.01 සිට 2025.03.31 දක්වා එරාවුර්පත්තු, වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(ii) පැවති රජයේ විශේෂ වැඩසටහනක් යටතේ එම පුද්ගලයන්ට 'උරුමය' සින්නක්කර ඔප්පු ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iv) 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද ඉහත පුද්ගලයන් අතරින් ඇතැම් පුද්ගලයන්ට එම ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(v) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) ඔවුන්ට මේ දක්වා 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

889/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් පිරිනමනු ලබන 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' නොමැතිව මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවුර්පත්තු, වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පුද්ගලයන් පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයින්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම රජයේ ඉඩම්වලින් ඉහත පුද්ගලයන් නීත්‍යානුකූලව ඉවත් කිරීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඔවුන්ට එරෙහිව අධිකරණයේ නඩු පවරා තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(v) අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු පැවරූ පුද්ගලයන් අතරින් ඉහත කාලසීමාවේදී අධිකරණ නියෝග මත රජයේ ඉඩම්වලින් ඉවත්කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(vi) නඩු පැවරිය යුතු එහෙත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු නොපවරන ලද පුද්ගලයන් සිටීද;

(vii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(viii) කිහිපදෙනෙකුට එරෙහිව පමණක් නඩු පැවරීමටත්, වැඩි පිරිසකට එරෙහිව නඩු නොපැවරීමටත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

2058/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සිට 2025 දක්වා එක් එක් වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ —

(i) වාර්තාවී ඇති දරු උපත් සංඛ්‍යාව;

(ii) දරු උපත් සංඛ්‍යාවේ අඩුවීම එක් එක් වර්ෂයට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ දරු උපත් සංඛ්‍යාව අඛණ්ඩව පහළ යාමට හඳුනාගෙන ඇති හේතු කවරේද;

(ii) දරු උපත් සංඛ්‍යාව පවත්වාගෙන යායුතු ප්‍රශස්ත අගය කොපමණද;

(iii) දරු උපත් සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා දරුවන් අපේක්ෂා කරන පවුල් වෙත යම් සහන හෝ වරප්‍රසාද ලබාදීමට අපේක්ෂා කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?